# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 1780/31 - 2012 ඔක්තෝබර් මස 19 වැනි සිකුරාදා - 2012.10.19

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස: (I) වැනි ඡේදය - සාමාන්‍ය

එල්.ඩී.—බී 4/96.

**1996 අංක 2 දරන ධීවර සහ ජලජ සම්පත් පනත**

1996 අංක 2 දරන ධීවර හා ජලජ සම්පත් පනතේ 61 වන වගන්තිය යටතේ ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යවරයා විසින් සාදන ලද නියෝග.

වෛද්‍ය රාජිත සේනාරත්න,
ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍ය.

2012 ඔක්තෝබර් මස 08 වැනි දින,
කොළඹ දී ය.

නියෝග

1. මෙම නියෝග 2012 ධීවර කළමනාකරණ අජීවී බෙල්ලන්ගේ කවච එකතු කිරීමේ නියෝග යනුවෙන් හඳුන්වනු ලැබේ.

2. අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් තත් කාර්යය සඳහා නිකුත් කරනු ලැබූ වලංගු බලපත්‍රයක අධිකාරය යටතේ හැර කිසිම තැනැත්තකු විසින් ශ්‍රී ලංකා ජල තීරයේ හෝ ඊට යාබද වෙරළ කලාපයේ වාණිජ කටයුතු සඳහා අජීවී බෙල්ලන්ගේ කවච ගැනීම, ඉවත් කිරීම, එකතු කිරීම, රැස් කිරීම හෝ ප්‍රවාහනය කිරීම නොකළ යුතු ය.

3. අජීවී බෙල්ලන්ගේ කවච ලබා ගැනීමේ, ඉවත් කිරීමේ, එකතු කිරීමේ හෝ රැස් කිරීමේ කාර්ය සඳහා කිසිම තැනැත්තකු විසින් යන්ත්‍රානුසාරයෙන් කැණීම් කටයුතු කිරීමේ නොයෙදිය යුතු ය.

4. 2 වැනි නියෝගයේ සඳහන් බලපත්‍රයක් සඳහා වූ සෑම ඉල්ලීමක්, මෙහි I වැනි උපලේඛනයේ සඳහන් ආකෘති පත්‍රයට සාරානුකූලව අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත හෝ අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් පත් කරන ලද බලපත්‍ර දීමේ නිලධරයකු වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

5. 2 වැනි නියෝගය යටතේ නිකුත් කරනු ලබන සෑම බලපත්‍රයක්ම -

(අ) II වැනි උපලේඛනයේ නිශ්චිතව දැක්වෙන ආකෘති පත්‍රයට සාරානුකූලව ඉදිරිපත් කළ යුතු අතර, එම බලපත්‍රය කලින් අවලංගු කරනු ලැබුවහොත් මිස, නිකුත් කළ දිනයේ සිට මාස හයක කාලයක් සඳහා බලාත්මකව තිබිය යුතු ය ; සහ

(ආ) මෙම බලපත්‍රයේ නිශ්චිතව දැක්වෙන නියම හා කොන්දේසිවලට යටත්ව නිකුත් කරනු ලැබිය යුතු ය.

6. අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් නිකුත් කරන ලද වලංගු බලපත්‍රයක අධිකාරය යටතේ මිස, කිසිම තැනැත්තකු විසින් අජීවී බෙල්ලන්ගේ කවච සන්තකයේ තබා ගැනීම හෝ ප්‍රවාහනය කිරීම නොකළ යුතු ය.

1A - PG 01413— 2,830 (2012/10)

7. 6 වැනි නියෝගයේ සඳහන් බලපත්‍රයක් සඳහා වූ සෑම ඉල්ලීමක් ම -

(අ) මෙහි III වැනි උපලේඛනයේ නිශ්චිතව දැක්වෙන ආකෘති පත්‍රයට සාරානුකූලව අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත හෝ අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් පත් කරන ලද බලපත්‍ර දීමේ නිලධරයකු වෙත ඉදිරිපත් කළ යුතු ය ; සහ

(ආ) අජීවී බෙල්ලන්ගේ කවච කිලෝග්‍රෑම් දහසක් සඳහා රුපියල් පන්සිය (රු. 500.00) බැගින් ගණන් බලනු ලබන ගාස්තුවක් ද සමග ඉදිරිපත් කළ යුතු ය.

8. 6 වැනි නියෝගය යටතේ නිකුත් කරනු ලබන සෑම බලපත්‍රයක් ම -

(අ) මෙහි IV වැනි උපලේඛනයේ නිශ්චිතව දැක්වෙන ආකෘති පත්‍රයට අනුව විය යුතු අතර, එය කලින් අවලංගු කරනු ලැබුවහොත් මිස, එය නිකුත් කළ දින සිට මාස හයක කාලයක් සඳහා බලාත්මකව පැවතිය යුතු ය ; සහ

(ආ) එම බලපත්‍රය එහි නිශ්චිතව දැක්වෙන නියම හා කොන්දේසිවලට යටත්ව නිකුත් කරනු ලැබිය යුතු ය.

9. අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් නිකුත් කරනු ලබන විසිතුරු භාණ්ඩ කර්මාන්තය සඳහා වූ වලංගු බලපත්‍රයක අධිකාරය යටතේ මිස, කිසි ම තැනැත්තකු විසින් අජීවී බෙල්ලන්ගේ කවච සන්තකයේ තබා ගැනීම, විකිණීම, විකිණීම සඳහා ප්‍රදර්ශනය කිරීම හෝ ප්‍රවාහනය කිරීම නොකළ යුතු ය.

10. 9 වැනි නියෝගයේ සඳහන් බලපත්‍රයක් සඳහා වූ සෑම ඉල්ලීමක් ම -

(අ) මෙහි V වැනි උපලේඛනයේ නිශ්චිතව දැක්වෙන ආකෘති පත්‍රයට සාරානුකූලව අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත හෝ ඔහු විසින් පත් කරනු ලබන බලපත්‍ර දීමේ නිලධරයා වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය ; සහ

(ආ) රුපියල් දෙසිය පනහක (250/-) ගාස්තුවක් සමග ඉදිරිපත් කළ යුතු ය.

11. 9 වැනි නියෝගය යටතේ නිකුත් කරනු ලබන සෑම බලපත්‍රයක් ම -

(අ) මෙහි VI වැනි උපලේඛනයේ සඳහන් ආකෘති පත්‍රයට අනුව විය යුතු අතර, එය කලින් අවලංගු කරනු ලැබුවහොත් මිස, නිකුත් කරනු ලැබූ දින සිට මාස හයක කාලයක් සඳහා බලාත්මකව පැවතිය යුතු ය ; සහ

(ආ) එම බලපත්‍රයේ සඳහන් නියම හා කොන්දේසිවලට යටත්ව නිකුත් කරනු ලැබිය යුතු ය.

12. සම්පත්වල චිරස්ථායීතාව සහ කමිටුවට කරනු ලබන නිර්දේශ සැලකිල්ලට ගෙන නිකුත් කළ හැකි බලපත්‍ර සංඛ්‍යාව අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් තීරණය කරනු ලැබිය හැකි ය.

13. බලපත්‍ර දරන්නා -

(අ) 1996 අංක 2 දරන ධීවර හා ජලජ සම්පත් පනතේ විධිවිධාන හෝ එය යටතේ සාදන ලද යම් නියෝගයක් ; හෝ

(ආ) එම බලපත්‍රයේ සඳහන් යම් නියමයක් හෝ කොන්දේසියක්,

උල්ලංඝනය කර ඇත්නම්, අධ්‍යක්ෂ ජනරාල්වරයා හෝ ඔහු විසින් පත් කරනු ලබන බලපත්‍ර දීමේ නිලධරයා විසින් බලපත්‍රය අවලංගු කරනු ලැබිය හැකි ය.

එසේවූවද, එම බලපත්‍රය අවලංගු කිරීමට පෙර අධ්‍යක්ෂ ජනරාල්වරයා හෝ ඔහු විසින් පත්කරනලද බලපත්‍ර දීමේ නිලධරයා විසින් බලපත්‍ර දරන්නා වෙත කරුණු ඉදිරිපත් කිරීමේ අවස්ථාවක් ලබාදිය යුතු ය.

14. මේ නියෝගවල -

"කමිටුව" යන්නෙන්, සම්පත් තිබීමට අදාළ කාරණා සමාලෝචනය කිරීම සඳහා අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් පත් කරන කමිටුවක් අදහස් වේ ;

"අජීවී බෙල්ලන්ගේ කවච" යන්නෙන්, මොලුස්කා වංශයට අයත් (හක් බෙල්ලන් හැර) මිය ගිය බෙල්ලන්ගේ බෙලි කටු අදහස් වේ ;

"අධ්‍යක්ෂ ජනරාල්වරයා" යන්නෙන්, 1996 අංක 2 දරන ධීවර සහ ජලජ සම්පත් පනතේ 2 වැනි වගන්තිය යටතේ පත් කරනු ලැබූ අධ්‍යක්ෂ ජනරාල්වරයා අදහස් වේ ;

"බලපත්‍ර දීමේ නිලධරයා" යන්නෙන්, 1996 අංක 2 දරන ධීවර සහ ජලජ සම්පත් පනතේ 6 වැනි වගන්තිය යටතේ පත් කරනු ලැබූ බලපත්‍ර දීමේ නිලධරයා අදහස් වේ ;

"ශ්‍රී ලංකා ජල තීරය" යන්නට, 1996 අංක 2 දරන ධීවර සහ ජලජ සම්පත් පනතේ ඊට දී ඇති අර්ථයම ඇත්තේ ය.

(4 වැනි නියෝගය)

I වැනි උපලේඛනය

**ශ්‍රී ලංකා ජල තීරයේ අජීවී බෙල්ලන්ගේ කවච ගැනීම, ඉවත් කිරීම,**
**එකතු කිරීම, රැස් කිරීම සඳහා වූ ඉල්ලුම් පත්‍රය**

01. ඉල්ලුම්කරුගේ සම්පූර්ණ නම :

02. අ. ඉල්ලුම්කරුගේ ස්ථිර ලිපිනය :
ආ. තැපැල් ලිපිනය :
ඇ. විද්‍යුත් තැපෑල :

03. ජාතික හැඳුනුම්පත් අංකය :

04. අජීවී බෙල්ලන්ගේ කවච ඉවත් කරනු ලබන ස්ථානය :

05. අජීවී බෙල්ලන්ගේ කවච ඉවත් කිරීම සඳහා භාවිත කරනු ලබන බෝට්ටුව/වල විස්තර :
අ. බෝට්ටුවේ වර්ගය :
ආ. බෝට්ටුවේ දිග :
ඇ. බෝට්ටුවේ බර :
ඈ. ලියාපදිංචි අංකය :
ඉ. එන්ජිමේ අශ්ව බලය :
ඊ. ඇතුළත හෝ පිටත සවි කරන ලද එන්ජිමක්ද යන බව :
එ. ධීවර මෙහෙයුම සඳහා යොදා ගනු ලබන ගැනියන් ගණන :
(නියමුවා ද ඇතුළුව)

06. අජීවී බෙල්ලන්ගේ කවච ඉවත් කිරීම සඳහා අදහස් කරන කාලය සහ වේලාවන් :

07. ඉවත් කිරීමට අදහස් කරනු ලබන අජීවී බෙල්ලන්ගේ කවච ප්‍රමාණය කිලෝ ග්‍රෑම් වලින් :

ඉහත ප්‍රකාශය මගේ උපරිම දැනීමේ හැටියට සත්‍ය හා නිවැරදි බව මම සහතික කරමි. අවසර පත්‍රයේ දක්වා ඇති නියම හා කොන්දේසි වලින් සහ 2012 අජීවී බෙල්ලන්ගේ කවච එකතු කිරීමේ ධීවර මෙහෙයුම් නියෝග වලින් ද මා බැඳී සිටිමි.

......................................................
ඉල්ලුම්කරුගේ අත්සන.

දිනය :

*කාර්යාලීය ප්‍රයෝජනය සඳහා පමණයි.*

ධීවර පරීක්ෂක/ක්ෂේත්‍ර නිලධාරියාගේ නිරීක්ෂණ :

*නිලධරයාගේ අත්සන*
නම :
තනතුර :
ප්‍රදේශය :
දිනය :

දිස්ත්‍රික් සහකාර අධ්‍යක්ෂවරයාගේ නිර්දේශය

.................................................................................. හි පදිංචි ............................................................................................ නැමැති ඉල්ලුම්කරුට පහත සඳහන් කොන්දේසි වලට යටත්ව, මෙහි විස්තර කරන අජීවී බෙල්ලන්ගේ කවච ඉවත් කිරීම සඳහා බලපත්‍රයක් ලබා දීමට මම මෙයින් නිර්දේශ කරමි/නොකරමි.

1.
2.
3.

*නිලධරයාගේ අත්සන*

නම :
තනතුර :
ප්‍රදේශය :
දිනය :

අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ/බලපත්‍ර දීමේ නිලධරයාගේ නියෝගය

බලපත්‍රයක් නිකුත් කිරීම අනුමත කරමි/නොකරමි

අනුමත කරන්නේ නම් බලපත්‍රයට ඇමිණිය යුතු විශේෂ කොන්දේසි :

අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ/බලපත්‍ර දීමේ නිලධරයාගේ අත්සන

නම :
තනතුර :
දිනය :

(5 වැනි නියෝගය)

II වැනි උපලේඛනය

ධීවර සහ ජලජ සම්පත් දෙපාර්තමේන්තුව
නව මහලේකම් කාර්යාලය,
මාලිගාවත්ත, කොළඹ 10,

බලපත්‍ර අංකය :

**අජීවී බෙල්ලන්ගේ කවච එකතු කිරීම, රැස් කිරීම,**
**ප්‍රවාහනය කිරීම සහ ඉවත් කිරීම සඳහා බලපත්‍රය**

.......................................................................... හී පදිංචි .............................................................................. ට අජීවී බෙල්ලන්ගේ කවච කිලෝ ග්‍රෑම් .................................. ඉවත් කිරීම සඳහා මෙයින් අවසර දෙමි.

1. මෙම බලපත්‍රය ........................................ දින සිට ............................................ දින දක්වා කාලයකට වලංගු විය යුතු ය.
2. මෙම බලපත්‍රය පහත දැක්වෙන නියම හා කොන්දේසිවලට යටත් විය යුතු ය:-

   i. මේ බලපත්‍රය මෙහි නම් කර ඇති තැනැත්තා විසින් භාවිත කරනු ලැබිය යුතු අතර, එය වෙනත් යම් තැනැත්තකුට පැවරීම නොකළ යුතු ය.
   ii. මේ බලපත්‍රය 2012 අජීවී බෙල්ලන්ගේ කවච එකතු කිරීමේ ධීවර කළමනාකරණ නියෝග වල විධිවිධාන වලට යටත් විය යුතු ය.
   iii. අළුත් බලපත්‍රයක් සඳහා ඉල්ලුම් කරන අවස්ථාවේ දී අජීවී බෙල්ලන්ගේ කවච ගැනීම, ඉවත් කිරීම, එකතු කිරීම, රැස්කිරීම හෝ ප්‍රවාහනය කිරීමට අදාල ලදුපත් සමග කලින් පැවති බලපත්‍රය භාර දිය යුතු ය.
   iv. මෙම බලපත්‍රය නිකුත් කරනු ලැබුවේ යම් කාර්යයක් සඳහා ද එම කාර්යයහැර වෙනත් යම් ධීවර කටයුත්තක් සඳහා එම බලපත්‍රය භාවිත නොකළ යුතු ය.

.........................................................................
අධ්‍යක්ෂ ජනරාල්,
ධීවර සහ ජලජ සම්පත් දෙපාර්තමේන්තුව.

දිනය :

(7 වැනි නියෝගය)

III වැනි උපලේඛනය

**අජීවී බෙල්ලන්ගේ කවච සන්තකයේ තබා ගැනීම සහ ප්‍රවාහනය සඳහා වන ඉල්ලුම් පත්‍රය**

01. ඉල්ලුම්කරුගේ සම්පූර්ණ නම :

02. අ. ඉල්ලුම්කරුගේ ස්ථිර ලිපිනය :
ආ. තැපැල් ලිපිනය :
ඇ. විද්‍යුත් තැපෑල :

03. ජාතික හැඳුනුම්පත් අංකය :

04. අජීවී බෙල්ලන්ගේ කවච ඉවත් කරනු ලබන ස්ථානය :

05. ප්‍රවාහන ක්‍රමය :
අ. වාහන අංකය :
ආ. ප්‍රවාහන මාර්ගය :

06. සන්තකයේ හෝ ගබඩා කරන ලද ස්ථානය :

ඉහත ප්‍රකාශය මගේ උපරිම දැනීමේ හැටියට සත්‍ය හා නිවැරදි බව මම සහතික කරමි. අවසර පත්‍රයේ දක්වා ඇති නියම හා කොන්දේසි වලින් සහ 2012 අජීවී බෙකවච එකතු කිරීමේ ධීවර කළමනාකරණ නියෝග වලින් ද මා බැඳී සිටිමි.

......................................................
ඉල්ලුම්කරුගේ අත්සන.

දිනය :

*කාර්යාලීය ප්‍රයෝජනය සඳහා පමණයි.*

ධීවර පරීක්ෂක/ක්ෂේත්‍ර නිලධාරියාගේ නිරීක්ෂණ :

*නිලධරයාගේ අත්සන*
නම :
තනතුර :
ප්‍රදේශය :
දිනය :

දිස්ත්‍රික් සහකාර අධ්‍යක්ෂවරයාගේ නිර්දේශය

.................................................................................. හි පදිංචි .................................................................................... නැමැති ඉල්ලුම්කරුට පහත සඳහන් කොන්දේසි වලට යටත්ව, මෙහි විස්තර කරන අජීවී බෙල්ලන්ගේ කවච සන්තකයේ තබා ගැනීම සහ ප්‍රවාහනය සඳහා බලපත්‍රයක් ලබා දීමට මම මෙයින් නිර්දේශ කරමි/නොකරමි.

1.
2.
3.

*නිලධරයාගේ අත්සන*
නම :
තනතුර :
ප්‍රදේශය :
දිනය :

අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ/බලපත්‍ර දීමේ නිලධරයාගේ නියෝගය

බලපත්‍රයක් නිකුත් කිරීම අනුමත කරමි/නොකරමි.

අනුමත කරන්නේ නම් බලපත්‍රයට ඇමිණිය යුතු විශේෂ කොන්දේසි :

අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ/බලපත්‍ර දීමේ නිලධරයාගේ අත්සන
නම :
තනතුර :
දිනය :

(8 වැනි නියෝගය)

IV වැනි උපලේඛනය

ධීවර සහ ජලජ සම්පත් දෙපාර්තමේන්තුව
නව මහලේකම් කාර්යාලය,
මාලිගාවත්ත, කොළඹ 10,

බලපත්‍ර අංකය :

**අජීවී බෙල්ලන්ගේ කවච සන්තකයේ තබා ගැනීම සහ ප්‍රවාහනය සඳහා ව ඉල්ලුම් පත්‍රය**

............................................................................ හි පදිංචි ............................................................................ ට අජීවී බෙල්ලන්ගේ කවච සන්තකයේ තබා ගැනීම සහ ප්‍රවාහනය සඳහා මෙයින් අවසර දෙමි.

1. මෙම බලපත්‍රය ......................................... දින සිට ............................................. දින දක්වා මාස 6ක කාල සීමාවකට වලංගු විය යුතු ය.

2. මෙම බලපත්‍රය පහත දැක්වෙන නියම හා කොන්දේසිවලට යටත් විය යුතු ය :-

i. මෙම බලපත්‍රය මෙහි නම් කර ඇති තැනැත්තා විසින් භාවිත කරනු ලැබිය යුතු අතර මම එය වෙනත් යම් තැනැත්තකුට පැවරීම නොකළ යුතු ය.

ii. මෙම අවසර පත්‍රය 2012 අජීවි බෙකවච එකතු කිරීමේ ධීවර කළමනාකරණ නියෝග වල විධිවිධාන වලට යටත් විය යුතු ය.

iii. අළුත් බලපත්‍රයක් සඳහා ඉල්ලුම් කරන අවස්ථාවේ දී අජීවී බෙල්ලන්ගේ කවච ලබා ගැනීම, ඉවත් කිරීම, එකතු කිරීම, රැස්කිරීම හෝ ප්‍රවාහනය කිරීමට අදාල ලදුපත් සමග කලින් පැවති බලපත්‍රය භාර දිය යුතු ය.

..........................................................................
අධ්‍යක්ෂ ජනරාල්,
ධීවර සහ ජලජ සම්පත් දෙපාර්තමේන්තුව.

දිනය :

(10 වැනි නියෝගය)

V වැනි උපලේඛනය

**විසිතුරු භාණ්ඩ කර්මාන්තය සඳහා අජීවී බෙල්ලන්ගේ කවච සන්තකයේ තබා ගැනීම විකිණීම, විකිණීම සඳහා ප්‍රදර්ශනය කිරීම හෝ ප්‍රවාහනය සඳහා වන ඉල්ලුම් පත්‍රය**

01. ඉල්ලුම්කරුගේ සම්පූර්ණ නම :

02. අ. ඉල්ලුම්කරුගේ ස්ථිර ලිපිනය :
ආ. තැපැල් ලිපිනය :
ඇ. විද්‍යුත් තැපෑල :

03. ජාතික හැඳුනුම්පත් අංකය :

04. අජීවී බෙල්ලන්ගේ කවච ඉවත් කරනු ලබන ස්ථානය/ස්ථාන :

05. ප්‍රවාහන ක්‍රමය :
අ. වාහන අංකය :
ආ. ප්‍රවාහන මාර්ගය :

06. සන්තකයේ තබා ගන්නා හෝ ව්‍යාපාරය පවත්වා ගෙන යන ස්ථානය :

ඉහත ප්‍රකාශය මගේ උපරිම දැනීමේ හැටියට සත්‍ය හා නිවැරදි බව මම සහතික කරමි. අවසර පත්‍රයේ දක්වා ඇති නියම හා කොන්දේසි වලින් සහ 2012 අජීවී බෙල්ලන්ගේ කවච එකතු කිරීමේ ධීවර නියෝග වලින් ද මා බැඳී සිටිමි.

.......................................................

දිනය : ඉල්ලුම්කරුගේ අත්සන.

*කාර්යාලීය ප්‍රයෝජනය සඳහා පමණයි.*

ධීවර පරීක්ෂක/ක්ෂේත්‍ර නිලධාරියාගේ නිරීක්ෂණ :

*නිලධරයාගේ අත්සන*

නම :

තනතුර :

ප්‍රදේශය :

දිනය :

දිස්ත්‍රික් සහකාර අධ්‍යක්ෂවරයාගේ නිර්දේශය

.................................................................................... හි පදිංචි ............................................................................................ නැමැති අය අජීවී බෙලිකටු භාවිතයෙන් විසිතුරු භාණ්ඩ කර්මාන්තයේ යෙදෙන බව/ව්‍යාපාරයක් පවත්වා ගෙන යන බැවින්, පහත සඳහන් කොන්දේසි වලට යටත්ව, මෙහි විස්තර කරන අජීවී බෙල්ලන්ගේ කවච එකතු කිරීම සඳහා බලපත්‍රයක් ලබා දීමට මම මෙයින් නිර්දේශ කරමි/නොකරමි.

1.

2.

3.

*නිලධරයාගේ අත්සන*

නම :

තනතුර :

ප්‍රදේශය :

දිනය :

අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ/බලපත්‍ර දීමේ නිලධරයාගේ නියෝගය

බලපත්‍රයක් නිකුත් කිරීම අනුමත කරමි/නොකරමි

අනුමත කරනු ලැබුවේ නම් ඇමිණිය යුතු විශේෂ කොන්දේසි :

අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ/බලපත්‍ර දීමේ නිලධරයාගේ අත්සන

නම :

තනතුර :

දිනය :

(11 වැනි නියෝගය)

VI වැනි උපලේඛනය

ධීවර සහ ජලජ සම්පත් දෙපාර්තමේන්තුව
නව මහලේකම් කාර්යාලය,
මාලිගාවත්ත, කොළඹ 10,

බලපත්‍ර අංකය ඃ

**විසිතුරු භාණ්ඩ කර්මාන්තය සඳහා අජීවී බෙල්ලන්ගේ කවච සන්තකයේ තබා ගැනීම, විකිණීම, විකිණීම සඳහා ප්‍රදර්ශනය කිරීම හෝ ප්‍රවාහනය සඳහා වන බලපත්‍රය**

............................................................................ හි පදිංචි ............................................................................... ට විසිතුරු භාණ්ඩ කර්මාන්තය සඳහා අජීවී බෙල්ලන්ගේ කවච සන්තකයේ තබා ගැනීම, විකිණීම, විකිණීම සඳහා ප්‍රදර්ශනය කිරීම හෝ ප්‍රවාහනය සඳහා මෙයින් අවසර දෙමි.

1. මෙම බලපත්‍රය ......................................... දින සිට ............................................. දින දක්වා අවුරුදු 01 ක කාල සීමාවක් සඳහා වලංගු විය යුතු ය.

2. මෙම අවසරපත්‍රය පහත දැක්වෙන නියම හා කොන්දේසිවලට යටත් විය යුතු ය :-

i. මේ බලපත්‍රය මෙහි නම් කර ඇති තැනැත්තා විසින් භාවිත කරනු ලැබිය යුතු අතර එය වෙනත් යම් තැනැත්තකුට, පැවරීම නොකළ යුතු ය.

ii. මේ අවසර පත්‍රය 2012 අජීවී බෙල්ලන්ගේ කවච එකතු කිරීමේ ධීවර කළමනාකරණ නියෝග වල විධිවිධාන වලට යටත් විය යුතු ය.

iii. අළුත් බලපත්‍රයක් සඳහා ඉල්ලුම් කරන අවස්ථාවේ දී අජීවී බෙල්ලන්ගේ කවච ලබා ගැනීම, ඉවත් කිරීම, එකතු කිරීම, රැස්කිරීම හෝ ප්‍රවාහනය කිරීමට අදාල ලදුපත් සමග කලින් පැවති බලපත්‍රය භාර දිය යුතු ය.

..........................................................................
අධ්‍යක්ෂ ජනරාල්,
ධීවර සහ ජලජ සම්පත් දෙපාර්තමේන්තුව.

දිනය ඃ

11-231

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.